# Excavation for your Meditation Hall in Progress... Sadu!!!

**Mahamevnawa Buddhist Monastery**
Buddha Meditation Centre
of Greater Toronto

Namo Buddhaya!
Dear Meritorious devotee,



පූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේගේ
කාරුණික ආශීර්වාදයෙන්, මහමෙව්නාව - Toronto Canada
භාවනා අසපුවේ, ගෞතම බුදුරජාණන් වහන්සේගේ නාමයෙන් ඉදිවන,

## බුද්ධ භාවනා ශාලාව

සඳහා
Rezoning approval, Site Plan approval, Building permit approval සහ excavation
වෙනුවෙන් ධන-ශ්‍රම පරිත්‍යාග කල දු දරු,
දෙමව්පිය හා සියලු පින්වතුන්ට ද,
ශ්‍රම පරිත්‍යාග කල සියලු ඉංජිනේරු පින්වතුන්ටද,
සම්බන්ධිකරණ හා සංවිධාන කටයුතු කල සියලු පින්වතුට ද,
Markham City හා York Region අංශවලට අදාල මැති ඇමති වරුන් සියලු දෙනාටද,
මහමෙව්නා වාසී හා ලෝකවාසී සියලූ ස්වාමීන් වහන්සේටද
අනාගරිකා මෑණිවරුන්ටද,
සියලූ දේව - බ්‍රහ්ම -නාග පිරිසටද,
රට වාසී, ලක් වාසී, ලෝක වාසී සැමටද,
ගුරුදේවෝත්තම පින්වත් ලොකු ස්වාමීන් වහන්සේටද,
තුණුරුවන් සරණින් - දෙව් රැකවරණින් සියලූ යහපත වේවා!
ගෞතම බුදු සසුනේ උතුම් චාතුරාර්ය සත්‍ය අවබෝධ වේවා!

මෙයට මෙත් සිතින්
ස්වාමීන් වහන්සේලා - මහමෙව්නාව භවනා අසපුව - Toronto -Canada



New Meditation Hall Web page for more details....

View now

# නමෝ බුද්ධාය!

“**ධර්ම ශාලාවක් හදන්නේ මොනවටද?** හෙවනක් යට නිදහසේ අහන්නයි

**මොකක් අහන්නද?** ධර්මය අහන්නයි

**කාගෙ ධර්මයද?** බුදු රජාණන් වහන්සේගේ ධර්මය සැනසිල්ලේ අහන්නයි ධර්ම ශාලාවක අවශ්‍යතාවය තියෙන්නේ

**බුදු රජාණන් වහන්සේගේ ධර්මය හරි විදියට ඇහුවොත්, හරියට ඇහුනොත්, ඒකෙ ප්‍රතිඵලය මොකද්ද?** *චතුරාර්ය සත්‍යය අවබෝධ වෙනව.......... සතර අපායෙන් එතෙර වෙනව*

ධර්ම ශාලාවක් හදන්න අපි උදව් කලොත්, ඒක තමන්ගේ ගෙදරට නෙවේ, දරුවෙකුට නෙවේ, නෑදෑයෙකුට නෙවේ, මිත්‍රයෙකුට නෙවේ, වාසියක් ගන්න නෙවේ, උදව්වක් ගන්න නෙවේ, ............ *ඒක දීමක්, ඒක අතහැරීමක්.*

ඒක අතහරින්නේ මොකටද? “අව්වෙන්, වැස්සෙන්, පින්නෙන් පීඩාවක් නොවී සුවසේ බණ අසත්වා!” ඕක නේද අදහස? එතකොට ඒ දානය දෙන්නේ අයිතියක් කියන්න නොවේ... ඒක හැබෑ අතහැරීමක්

එතකොට එබඳුවූ දානයක් දීල මේ ධර්ම ශාලාවේ යමෙක් බණ අසා බුදු රජාණන් වහන්සේ ගැන සිත පහදවා ගත්තොත්, බණ අසා අනේ මටත් මේ ධර්මයේ හැසිරෙන්න ඕන කියා හිතුනොත්, බණ අසා පැවිදි වුනොත්, බණ අසා ලෝභ චිත්තය දුරුකොට දානය දුන්නොත්, බණ අසා සීලයක පිහිටියොත්, ඒ ඔක්කොටම මේ වහලට සෙවන සැලසීමේ පින අයිති වෙන්නේ නැද්ද? අයිති වෙනවා.

ඒ නිසා මේ ධර්මය ලබාගන්න අන් අයට කරන උදව්වට, ධර්මයේ හැසිරෙන අයට ධර්ම දානය ලබා දෙන්න හදන ධර්ම ශාලාවට ඔබ හැමෝම උතුම්ම දානයක් කියල හිතල සහභාගී වෙන්න හැමෝටම වාසනාව ලැබේවා!”

(පරම පූජනීය පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ)